## පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/246/2025 (PSC)**

ඩබ්.ඩබ්.පී.ජේ.පී.කරුණාතිලක
**අභියාචක**

**එදිරිව,**
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය : 2026.02.12**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක නැත. අභියාචක වෙනුවෙන් ඇටෝර්නි බලපත්‍රයක් මත අභියාචකගේ ස්වාමිපුරුෂයා වන ජයසේනගේ අසේල රත්නායක පෙනී සිටී.
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුණතිලක මහතා.
වගඋත්තරකාර රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙනුවෙන් සහකාර ලේකම් ජේ.එම්.දිසානායක මහත්මිය.

### -නියෝගය-

අභියාචක වෙනුවෙන් විශේෂ ඇටෝර්නි බලපත්‍රයක් අභියාචනා පෙත්සම සමඟ පී-4 වශයෙන් සළකුණු කර ඉදිරිපත් කර ඇත. එම ඇටෝර්නි බලපත්‍රය අනුව අභියාචක වෙනුවෙන් මෙම අභියාචනය සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ජයසේනගේ අසේල රත්නායක යන අය පත් කර ඇත. එම අය අධිකරණයේ පෙනී සිටී.

අභියාචක වෙනුවෙන් පෙනී සිටි තිස්ස ගුණතිලක මහතා පහත සඳහන් කරුණු ඉදිරිපත් කරයි.

"අභියාචක මේ වන විටත් විදේශ ගත වී ඇති අතර, ඇයගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටීමට ස්වාමිපුරුෂයා වන ජයසේනගේ අසේල රත්නායක වෙත ඇටෝනි බලය පවරා ඇත. සේවය අතහැරයාමේ නියෝගයක් අභියාචක වෙත නිකුත් කර ඇති බව අභියාචනයේ සඳහන්ව ඇතත්, එම නියෝගය ඇයට

නොලැබුන බව සහ සේවය අතහැරයාමේ නියෝගය අදාළ කාර්යාලයේ දැන ගැනීමට ඇති බව පවසයි. සේවය අතහැරයාමේ නියෝගය වෙනුවෙන් මෙතෙක් අභියාචනයක් ඉදිරිපත් කර නොමැති අතර නිකුත් කර ඇති සේවය අතහැරයාමේ නියෝගය ලබාගෙන, ඒ සඳහා විධිමත් පරිදි අභියාචනයක් ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන හෙයින් මෙම ඉල්ලීම අභියාචනය ඉල්ලා අස්කර ගැනීමට අවසර පතමු.''

ඉහත සඳහන් ඉල්ලීම සළකා බලා මෙම අභියාචනය ඉල්ලා අස්කර ගැනීමට කර ඇති ඉල්ලීමට අවසර දෙමු. ඒ අනුව මෙම අභියාචනය නිෂ්ප්‍රභා කිරීමට තීරණය කරමු.

අභියාචනය නිෂ්ප්‍රභා කරමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/